**ශීර්ෂය 234 - ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්**

**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-------------------**

**1.1 තත්ත්වාගණනය නොකළ මතය**

**---------------------------------**

ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්හි 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්හි මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 02 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ආයතනයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම**

-----------------------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ආයතනය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ආයතනයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා

වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්**,** ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ,

**(ආ)** ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් හා නිවැරදිව නිසි සැලකිල්ලෙන් යුතුව පිළියෙල නොකිරීම නිසා වැය විෂයය 02 ක් සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් සලසා ගෙන තිබුණු රු.700,000 ක් වූ මුළු ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි. | 2021.08.28 දිනැති රාජ්‍ය වියදම් සමාලෝචනය පිළිබඳ සංදේශයට අනුව මෙම වැය විෂයන් වල ප්‍රතිපාදන අවුරා එම තොරතුරු 2021.09.21 දින භාණ්ඩාගාරයට දන්වා යවා ඇත. | වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේ දී මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව තාත්ත්වික හා නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කල යුතු වේ. |
| (ආ) | වැය විෂයයන් 02 ක් සඳහා සලසා ගෙන තිබුණු රු.2,500,000 ක් හා රු.3,000,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.2,096,982 ක් සහ රු.2,978,500 ක් හෙවත් සියයට 84 ක් සහ සියයට 99 ක් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | 2021.08.28 දිනැති රාජ්‍ය වියදම් සමාලෝචනය පිළිබඳ සංදේශයට අනුව මෙම වැය විෂයන් වල ප්‍රතිපාදන අවුරා තැබීමට කටයුතු කර ඇත. තවද කොවිඩ් 19 වසංගත තත්වය මත කාර්යාල කටයුතු නිසි පරිදි සිදු නොවූ බැවින්ද රාජ්‍ය වියදම් කළමනාකරණය නිසාද අනපේක්ෂිත ලෙස වියදම් සීමා කිරීමට සිදුවිය. | මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව සකසුරුවම් හා කාර්යක්ෂමතාවය පිළිබඳව නිසි සැලකිල්ලෙන් තාත්වික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වැය විෂයය 1409 සඳහා මුදල් රෙගුලාසි 66 මාරු කිරීම මඟින් රු.100,000 ක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණ ද වර්ෂය අවසානයේ රු.371,734 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබීමෙන් ප්‍රතිපාදන මාරු කිරීම් නිසි සැලසුමකින් යුක්තව සිදු කර තිබූ බවක් නිරීක්ෂණය නොවීය. | ඉදිරියේදී මේ පිළිබඳව අවධානය යොමු කර කටයුතු කරමි. | අවශ්‍යතාවය පරිදි සැලසුම් සහගතව අමතර ප්‍රතිපාදන සපයාගත යුතු වේ. |

**2.2** **බැරකම් හා බැඳීම්වලට එළඹීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ (සටහන **iii**) හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ (සටහන **iv**) දක්වා තිබූ බැරකම් ශේෂයන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ **SA -** 92 ට ඇතුලත් කර නොතිබුණි. | සිගාස් වැඩසටහනේ බැරකම් ලෙස ඇතුලත් කර ඇති නමුත් තාක්ෂණික දෝෂයක් නිසා භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශයේ 2020 වර්ෂයට අදාල දත්ත නිරූපනය විය. | සියළු බැඳීම් හා බැරකම් භාණ්ඩාගාර බැඳීම් හා බැරකම් ගිණුම් ප්‍රකාශය සමඟ සැසඳී තිබිය යුතු වේ. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබූ එකතුව රු.1,990,342 ක් වූ බැරකම්, බැරකම් ලේඛණයක ඇතුලත් කර තිබුණද, එහි බැරකම් නිරවුල් කිරීම සම්බන්ධයෙන් තොරතුරු ඇතුලත් කර නොතිබුණි. | බැරකම් ලේඛනයේ බැරකම් නිරවුල් කිරීම සම්බන්ධ තොරතුරු ඉදිරියේදී ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. | සියළුම බැරකම් සහ ඒවා නිරවුල් කිරීම් පිළිබඳ විස්තර බැරකම් ලේඛනයෙහි සටහන් කළ යුතු වේ. |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1645 | වාහන භාර නිලධාරියා විසින් තම භාරයේ පවතින එක් එක් වාහනය වෙනුවෙන් 267 වැනි පොදු ආකෘතිය ප්‍රකාරව ලොග් සටහන් පොතක් තබා ගත යුතු වුවත් ආයතනයේ සංචිත වාහන සඳහා ලොග් සටහන් පොත් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මු.රෙ. 1645 (අ) අනුව කටයුතු කිරීමට ප්‍රවාහන විෂය භාර නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | මුදල් රෙගුලාසි 1645 (අ) හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2021 නොවැම්බර් 26 දිනැති අංක 03/2021 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය | | | |
| (i) | 3.1 වගන්තිය | නව සිගාස් වෙබ් යෙදුම් පද්ධතියෙන් ලබා ගත් SA 40,SA 41, SA 60, හා SA 100 හි අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ මූල්‍ය ප්‍රකාශවලට අමුණා නොතිබුණි. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේ දී නිසි පරිදි ඉදිරිපත් කරමි. | 2021.11.26 දිනැති අංක 2021/03 දරන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සම්බන්ධයෙන් වූ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ |

| | | | | |
|---|---|---|---|---|
| | | | | යුතු වේ. |
| (ii) | 3.4 වගන්තිය | එක් එක් වැය විෂය සංකේතාංකයක් යටතේ සෑම වැය විෂයක් වෙනුවෙන්ම මුළු ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර වෙනස හා එම වෙනසට හේතු ACA-2(ii) ආකෘතියෙහි දැක්විය යුතු වුවද වැය විෂය 2401 හි සියයට 99 ක් වූ ප්‍රතිපාදන ඉතිරිවීම් සඳහා හේතු ඉතිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී එක් එක් වැය විෂයන්ගේ ඉතිරිවීම් සඳහා හේතු දැක්වීමට කටයුතු කරමි. | 2021.11.26 දිනැති අංක 2021/03 දරන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සම්බන්ධයෙන් වූ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (iii) | ඒසීඒ - 06 ආකෘතිය | නව සිගාස් වෙබ් යෙදුම මගින් ජනනය කරන ලද මූල්‍ය නොවන වත්කම් වාර්තාව වෙනුවට ආයතනයේ මූල්‍ය නොවන වත්කම් වාර්තාව ACA–6 ආකෘතියට අමුණා තිබුණි. | පිළිගනිමි. අතපසුවීමකින් සිදු වී ඇත. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | 2021.11.26 දිනැති අංක 2021/03 දරන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සම්බන්ධයෙන් වූ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1 වත්කම් කළමනාකරණය**

------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| වැය ශීර්ෂය 04 හි ප්‍රතිපාදන මගින් 2021 වර්ෂයේ මිල දී ගෙන තිබුණු රු. 9,383,680 ක් වටිනා කාර්යාලීය උපකරණ ද, රු. 5.595,188 ක් වටිනා යන්ත හා | ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව සතුව එක් ගබඩාවක් ඇති අතර එක් ගබඩා භාරකරුවකු සියළු කටයුතු කරනු ලබයි. එබැවින් ශීර්ෂ අංක 04 සඳහා වෙනම බඩු වට්ටෝරු පොතක් පවත්වාගෙන යාම සිදු කර නොමැති | මුදල් රෙගුලාසි 454(1) ප්‍රකාරව වැය ශීර්ෂ 04 සඳහා වෙනම බඩු වට්ටෝරු පොතක් පවත්වාගෙන යා යුතු වේ. |

යන්ත්‍රෝපකරණද වැය ශිර්ෂ අතර ඉදිරියේදී මෙය විධිමත් කිරීමට
234 ට අදාල බඩු වට්ටෝරු පියවර ගනු ලැබේ.
පොතට ඇතුලත් කර තිබුණි.

**3.2 කළමනාකරණ දුර්වලතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් 'බී' ගිණුමේ දෙපාර්තමේන්තු පොත් අනුව ණය ශේෂය හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව ණය ශේෂය අතර 2011 වසරේ සිට ඉදිරියට ගෙන එමින් පැවත එන රු.68,245 ක වෙනස තවදුරටත් නිරවුල් නොකොට සමාලෝචිත වර්ෂය දක්වාම ඉදිරියට ගෙනවිත් තිබුණි. | රු.68,245 ක වෙනස නිරවුල් කිරීම සඳහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කළ අතර ඉදිරියේදී තවදුරටත් එම ශේෂය නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | වසර ගණනාවක සිට දෙපාර්තමේන්තු පොත්වල වැඩියෙන් පෙන්වන මෙම ශේෂය නිරවුල් කල යුතු වේ. |
| (ආ) | පවත්වාගෙන යනු ලබන අත්තිකාරම් පාලන ගිණුම් නිසි පරිදි ලියා, මාසික භාණ්ඩාගාර ප්‍රකාශ සමඟ සන්සන්දනය කර නොතිබුණි. | 2021 වර්ෂයේ පැවති විවිධ හේතූන් මත අත්තිකාරම් පාලන ගිණුම නිසි පරිදි මාසිකව සැසඳීමට නොහැකි වූ අතර 2022 වර්ෂයේ එය ක්‍රමවත්ව සිදු කර ඇත. | 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව අත්තිකාරම් පාලන ගිණුම නිසි පරිදි ලියා ශේෂ කළ යුතු අතර මාසිකව භාණ්ඩාගාර පොත් සමඟ දෙපාර්තමේන්තු පොත් සැසඳිය යුතු වේ. |